සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	6 ශ්‍රේණිය	සිංහල භාෂාව හා සාහිත්‍යය I -II	කාලය / நேரம் / Time	පැය 02යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- I කොටසට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා, II කොටස සමඟ අමුණා භාර දෙන්න.

I කොටස

- 1 , 2 ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත සාම්ප්‍රදායික යෙදුම්වලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) **'නුපුරුදු කටයුත්තක් කිරීමට ගොස් අමාරුවේ වැටීම'** යන අරුතට ගැළපෙන ප්‍රස්තාව පිරුළ වන්නේ,
(i) බළලුන් ලවා කොස් ඇට බාවන්නා සේ (ii) අබරා සිල් ගත්තා වගේ
(iii) උගුරට හොරා බෙහෙත් කෑවා වගේ (iv) බීරි අලියාට වීණා වාදනය කරන්නා වාගේ

02) **'අං ඇවිල්ලා'** යන රූඪියට ගැළපෙන අරුත වනුයේ,
(i) පොහොසත් වෙලා (ii) හිතුවක්කාර වෙලා
(iii) අමනාප වෙලා (iv) ආඩම්බර වෙලා

- හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

03) උපාසිකාව බුදුන්ට මල් පූජා .....
(i) කළේ ය. (ii) කළෝ ය. (iii) කළා ය. (iv) කළෙහි.

04) ..... ගලා බසිති.
(i) ගංගාවෝ (ii) ගංගා (iii) ගංගාවන් (iv) ගංගාව

05) විදුහල්පතිතුමා .....අමතා කතා කළේ ය.
(i) ළමයින් (ii) ළමයි (iii) ළමයෙක් (iv) ළමෝ

- අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

06) (i) පුෂ්ඵය (ii) විශේෂ (iii) දුශ්කර (iv) දක්ශිණ

07) (i) ලමයා (ii) මහළු (iii) ලපටි (iv) වදාළ

- ප්‍රශ්න අංක 8-10 දක්වා ප්‍රශ්නවල පද තුනක් අර්ථයෙන් සමාන ය. **සමානාර්ථයක් නොදෙන** පදය තෝරන්න.

08) (i) භූපල් (ii) භූමිය (iii) ධරණි (iv) දෙරණ

09) (i) නුබ (ii) අහස (iii) ආකාශය (iv) සිදු

10) (i) ජලය (ii) පැන් (iii) උදක (iv) පවන්

Past Papers Wiki

- ප්‍රශ්න අංක 11-13 දක්වා අක්ෂර මාලාව හා පිලි ඇසුරින් පිළිතුරු සපයන්න.

11) සිංහල වර්ණ මාලාවේ ඇතුළත් අක්ෂර ගණන වන්නේ,
(i) 42 (ii) 62 (iii) 60 (iv) 40

12) **රූදුරු , පැදුරු** යන වචනවල මුල් අකුරේ යොදා ඇති පිල්ලම් පිළිවෙළින් දැක්වෙන්නේ,
(i) කෙටි පාපිල්ල , කෙටි ඇදපිල්ල (ii) කෙටි ඇදපිල්ල , කෙටි පාපිල්ල
(iii) කෙටි පාපිල්ල , කෙටි පාපිල්ල (iv) කෙටි ඇදපිල්ල , කෙටි ඇදපිල්ල

13) මහාප්‍රාණ අක්ෂරයක් **යෙදී නොමැති** වචනය තෝරන්න.
(i) ආඛ්‍යාතය (ii) කණ්ඩායම (iii) අනුභවය (iv) ලේඛනය

14) ' දිළිඳු ' යන පදයේ විරුද්ධාර්ථ පදය වන්නේ,
(i) අසරණ (ii) දුප්පත් (iii) උසස් (iv) පොහොසත්

15) වඩාත් සුදුසු විරාම ලකුණු යොදන්න.

අනේ මොකක්ද මේ වුණේ

- තද කළු අකුරින් මුද්‍රිත පදයට වඩාත් ගැළපෙන අරුත වන්නේ කුමක් ද?

16) " පිටතට යා නො හැකි සේ විශාල **කටුපැලැල්ලකින්** එය ආවරණය කරන ලද්දේ ය."
(i) බාධකයක් (ii) කන්දක් (iii) මුරපොළක් (iv) ආවරණයක්

17) "**දැරිය මිහිරි ගීයක් ගායනා කළා ය.** " යන වාක්‍යයේ නාම විශේෂණ පදය වන්නේ,
(i) ගායනා (ii) මිහිරි (iv) දැරිය (iv) ගීයක්

18) '**ගුරුතුමා සිංහල පාඩම හොඳින් උගන්වයි.**' යන වාක්‍යයේ ක්‍රියා විශේෂණ පදය වන්නේ,
(i) උගන්වයි (ii) ගුරුතුමා (iii) හොඳින් (iv) සිංහල

19) කවියක සෑම පදයක් ම එක ම අකුරකින් අවසන් වීම හඳුන්වන්නේ,
(i) එළිසමය (ii) රූපක (iii) උපමා (iv) අනුප්‍රාසය

20) " **කණාමැදිරියෝ තරු පොකුරක් මෙන් පියඹා යති.** " යන වාක්‍යයේ උපමාව සහ උපමේය වෙන් කර දක්වන්න.

උපමාව : .....

උපමේය:..... **(ලකුණු 2 × 20 = 40)**

Past Papers Wiki

II කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

01) ඔබ පන්තියේ මිතුරු මිතුරියන් කවි නිර්මාණය කොට නිර්මාණ සංග්‍රහයක් සකස් කළේ යැ යි සිතා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) නිර්මාණ සංග්‍රහය සඳහා යෙදූ නම කුමක් ද?
(ii) එම නිර්මාණ සංග්‍රහයේ ඇතුළත් ව තිබූ නිර්මාණ දෙකක තේමා මොනවා ද?
(iii) එම නිර්මාණ සංග්‍රහය සකස් කිරීමේ දී මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.
(iv) එම ගැටලු මග හරවා ගැනීමට ගත් ක්‍රියා මාර්ග මොනවා ද?
(v) එම නිර්මාණ සංග්‍රහය සකස් කිරීමෙන් ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

02) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු වන සේ රචනාවක් ලියන්න.

(i) අපේ සුන්දර ළමා ලෝකය
(ii) අසරණයන්ට පිහිට වෙමු.
(iii) මා කැමති ම ලේඛකයා
(iv) විවේක කාලය හරවත් ව ගත කරමු.
(v) සිංහල ජන කවිය

(ලකුණු 20)

03) පොත් ප්‍රදර්ශනයක් නැරඹීමට යාමට පැමිණෙන ලෙස දන්වමින් දුර බැහැර සිටින ඔබගේ මිතුරෙකුට පෞද්ගලික ලිපියක් ලියන්න. පොත් ප්‍රදර්ශනය පිළිබඳ විස්තර ආදිය ඇතුළත් කරන්න.

(ලකුණු 10)

04) පෙළ පොත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) " මාගේ පරම මිත්‍ර වූ තෙපි මට කවර හෙයින් දාමරික වූ හූ ද? "
(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක් ද?
(ආ) මෙම පාඩම උපුටා ගත් කෘතියේ රචකයා කවුද?

(ii) " ඒ වගේ අපේ මේ බාරාත් කවදා හරි මිනිහෙක් වෙයි "
(අ) මෙහි සඳහන් 'අපේ බාරා' යනු කවුද?
(ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් පාඩම කුමක් ද?

(iii) කළුගල් තළාලයි පාරට දමන්නේ
එම ගල් පැගිලයි ගොන් කුර ගෙවෙන්නේ
ගොනා නොවෙයි හරකයි බර අදින්නේ
.....
(අ) අවසන් පදය සම්පූර්ණ කරන්න.
(අ) මෙය කුමන වර්ගයට අයත් ජන කවියක් ද?

(iv) " කිමෙක් ද? දරුවෙනි , පැන් නොබොව් දැ "
(අ) මෙම ප්‍රකාශය සඳහන් පාඩමේ නම කුමක් ද?
(ආ) එම පාඩම උපුටා ගත් කෘතිය කුමක් ද?

(v) (අ) ' වාසනාවන් ' පද්‍ය පන්තියේ රචකයා කවුද?
(ආ) එම නිර්මාණයෙන් කියවෙන්නේ කුමක් ගැන ද?

(ලකුණු 2 × 5 = 10)

05) පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දත් කැකුළු පෑ ලා
සුරතල් සිනා සී ලා
බොළඳ බස් දී ලා
කෙළී සියලඟ දූලි ගා ලා

කඳ කුමරිදු ලෙසි න
බමුණු පැටියන් සමඟි න
නො මඳ සව් ඉසුරෙ න
වැඩිණි නව සඳ මෙන් දිනෙන් දින

නිති ගේ දොර ඇමද
කැලි කසළ දැක නොම ඉඳ
උදාසන සවස ද
පහන් දල්වව විමන නො වරද

(i) මෙහි සඳහන් කුඩා දරුවාගේ හැසිරීම් දෙකක් ලියන්න.
(ii) මෙහි සඳහන් කුමරු හැදී වැඩුණේ කවුරුන් සමඟ ද?
(iii) පද්‍ය පන්තියේ සඳහන් උපමා දෙකක් ලියන්න.
(iv) අවසාන කවියේ සඳහන් යහපත් පුරුදු මොනවා ද?
(v) 'නොමඳ' , 'සියලඟ ' යන පදවල අර්ථ ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank